SRI LANKA
CONVENTION BUREAU

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

# වාර්ෂික වාර්තාව 2015

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන හා
ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය



# වාර්ෂික වාර්තාව
# 2015

**ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය**
අංක. 78, හොටෙල් පාසල් ගොඩනැගිල්ල,
හතර වන මහළ, ගාලු පාර, කොළඹ - 03



**වාර්ෂික වාර්ථාව - 2015**

**ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය**
අංක. 78, ගාලු පාර, කොළඹ - 03,
ශ්‍රී ලංකාව.

ප්‍රින්ටෙක් ඒස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
011 2815816 | sales@printec.lk | www.printec.lk

## පටුන

විශේෂතා 04
ආර්ථික ඇගයීම 06
1. හැඳින්වීම 07
2. උපදේශනය-සහයෝගිත්වය-සම්බන්ධීකරණය (සාමාන්‍ය ක්‍රියාකාරකම්) 09
3. නව නිෂ්පාදන සකස් කිරීම 24
4. පර්යේෂණ සහ සංවර්ධන 25
5. පුහුණුව 28
6. උසස්වීම් 34
7. වෙනත් ක්‍රියාකාරකම් 53
8. කර්මාන්ත සම්බන්ධතා 54
9. මූල්‍ය සහ පරිපාලනය 55



***"ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ නව සභාපතිවරයා සහ නව අධ්‍යක්ෂ මංඩලය යටතේ එම ක්ෂේත්‍රයහි දියුණුවට විශාල කාර්යයක් සිදු කරයි. ඒ අනුව එකී කාර්යයන් සම්බන්ධව ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයට සුභපැතීමටද මෙය අවස්ථාවක් කර ගනිමු."***

# අමාත්‍යතුමාගේ පණිවිඩය

**සංචාරක සංවර්ධන, හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමාගේ පණිවිඩය**

වර්තමාන රජය සංචාරක කර්මාන්තය ආර්ථිකයේ වර්ධනයට මහත් පිටුවහලක් වන බව දැඩිසේ විශ්වාසය පළ කර ඇත. වාර්ෂික සංචාරකයන් පැමිණීමේ වර්ධනය සම්බන්ධව සලකා බලන විට 20% ක ප්‍රතිශතයක් විවේකය ගතකිරීමේ අරමුණින් පැමිණේ. ඒ අතර සංචාරකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් රැස්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශණ සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් වීම විශේෂ කරුණක් වන අතර ඒ තුලින් සුවිශේෂි වු ආදායමක් කර්මාන්තය තුල ජනිත වේ.

ඒ අනුව රැස්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශණ හා ලාභ උපදවන සම්මුතීන් වලින් ලැබෙන ආදායම සම්ප්‍රදායික සංචාරක කර්මාන්තය තුලින් ලැබෙන ආදායමට වඩා වැඩි වේ. MICE සංචරණය ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍ර එනම් ප්‍රවාහන, නවාතැන්, ආහාරපාන සම්මුති සේවා සහ සංග්‍රහ යනාදී අවශ්‍යතාවයන් කෙරෙහිද ප්‍රධාන බලපෑමක් සිදු කරයි.

ආසියානු කලාපීය MICE වෙළඳපොළෙහි ශ්‍රී ලාංකීය සහභාගීත්වය පසුගිය වසර කිහිපය තුල වර්ධනයක් දැකිය හැක. විශේෂයෙන්ම ඉන්දියාව සලකා බලන විට සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරේ. මෙම ක්ෂේත්‍රය දියුණු කරලීමට බලපාන ප්‍රධාන සාධකයක් වශයෙන් ක්‍රියාකාරකම් පවත්වන ස්ථානයන්හි යටිතල පහසුකම් වර්ධනය කිරීම සලකා බැලිය හැක. ඒ අනුව විශාල පරිමාණ සැලසුම් බස්නාහිර පළාත තුල ව්‍යප්ත කිරීමේදී මේ සම්බන්දව අනාගතයේදී සලකා බලනු ඇත.

මගේ අමාත්‍යංශය විසින් MICE සංචරණය දියුණු කරලීමට විශේෂ උනන්දුවක් දක්වන අතර ඒ තුල ඉලක්ක සපුරා ගැනීමේ විශ්වාසයක් ඇත. අප තවත් ඉලක්කයක් වනුයේ ඉහල ධාරිතාවයකින් යුක්ත සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් කොළඹ නගරය තුල ගොඩනැංවීම වේ. ප්‍රධාන වශයෙන් ඉන්දියානු හා චීන සංචාරක වෙලදපොළ තුල අනාගත වෙළඳ දැන්වීම් හා ප්‍රවර්ධන වැඩමුලු ක්‍රියාත්මක කිරීම තුලින් එම අරමුණ ඉටුකර ගත හැක.

ශ්‍රී ලංකාව තුල සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයන්හි අනාගත විශාල ආයෝජනයන් බලාපොරොත්තු වේ. එනම් Anantra, Sheraton,Movenpick, Hyaatt Regency, Shangri - La, Marriot, ITC, Silver Needle යන ප්‍රධාන ආයෝජන තුලින් සමුළු හා ප්‍රදර්ශණ පැවැත්වීමට මෙන්ම අවශ්‍ය යටිතල පහසුකම් ද බිහිවේ. ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයේ නව සභාපතිවරයා සහ නව අධ්‍යක්ෂ මංඩලය යටතේ එම ක්ෂේත්‍රයහි දියුණුවට විශාල කාර්යයක් සිදු කරයි. ඒ අනුව එකී කාර්යයන් සම්බන්ධව ශ්‍රී ලංකා සම්මුති කාර්යංශයට සුභපැතීමටද මෙය අවස්ථාවක් කර ගනිමු.



# විශේෂතා

### උපදේශනය. සහයෝගිතාවය සහ සම්බන්ධීකරණය

- 2016 SNAV සම්මන්ත්‍රණය
- ශ්‍රී ලංකාවේ පැවති PATA ලෝක සම්මන්ත්‍රණය
- REDBULL සමඟ සිදුකළ ඒකාබද්ධ ප්‍රවර්ධනය කිරීම්
- චීන සංචාරක නියෝජිතයන්ට ආගන්තුක සත්කාර/නවාතැන් සැපයීම
- මාධ්‍ය සම්මන්ත්‍රණය - LSR මැරතන් ධාවන තරඟය
- මාධ්‍ය සම්මන්ත්‍රණය - ලංකා චැලේන්ජ් 2015
- වෙබ් අඩවිය දියත් කිරීම සහ මාධ්‍ය හමුව - ICSE 2015
- නයිජල් බාකර් ශ්‍රී ලංකාවට පැමිණීම
- ජල සම්පත් සහ පරිසරය පිළිබඳ දෘෂ්ටිකෝණය පිළබඳ 8 වැනි අන්තර්ජාතිත සම්මන්ත්‍රණය (IPWE) 2016
- 20 වැනි IFCA ලංසුව සම්බන්ධ කාර්යයන් (අන්තර්ජාතික මූල්‍ය ගුප්තලේඛන සම්මේලන අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2016)
- චීනයේ බෞද්ධ සම්මමේනයේ සහ ෆුජියාන් පළාතේ නියෝජිත පිරිසක් සමඟ හමුව
- 2015 APICTA  සම්මාන සහ සම්බන්ධිත සිදුවීම්
- 2015 MICE සංචාරක වෙළඳපොළ
- ශ්‍රෙයා ගොහාල් ශ්‍රී ලංකාවට පැමිණීම
- ශ්‍රී ලංකාවේ MICE සම්බන්ධිත ක්‍රියාකාරකම් සඳහා අවස්ථා සහාය

### පුහුණුව

- යාපනයේ පැවති ප්‍රාදේශීය පුහුණු වැඩසටහන
- මහනුවර පැවති ප්‍රාදේශීය පුහුණු වැඩසටහන
- මීගමුවේ පැවති ප්‍රාදේශීය පුහුණු වැඩසටහන
- ගෝලීය යාත්‍රා කර්මාන්තය සහ එය ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ කෙසේද පිළිබඳ කතිකාවත-මහාචාර්ය රොස් ඩෝලින්ග්

### පර්යේෂණ

- 2013 MICE පර්යේෂණ සඟරාව නැවත දියත් කිරීම.
- 2014 අන්තර්ජාතික රැස්වීම් සංඛ්‍යාලේඛන ICCA ට ඉදිරිපත් කිරීම - SLCB විසින් සපයන ලද පර්යේෂණ යෙදවුම් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාව සඳහා ICCA විසින් හඳුනාගත් අන්තර්ජාතික අවස්ථා 31
- ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික අවස්ථා පිළිබද අඛණ්ඩ යාවත්කාලීන කිරීම් පිළිබඳව ෂක් සමඟ සන්නිවේදනය කිරීම.
- MICE අවස්ථා දිනදර්ශන යාවත්කාලීන කිරීම.
- SLCB හි කාර්යාභාරය සහ විෂයපථයී පිළිබඳව ඉදිරිපත් කිරීම සකස් කරන ලදී

- දත්ත සමුදා කළමනාකරණ මෘදුකාංගය සඳහා කොළඹ විශ්වවිද්‍යාලය පැවරීම-සිදු කරමින් පවතී.
- සංචාරක කර්මාන්තය සඳහා ජෛවවිවිධත්වය භාවිතා කිරීම පිළිබඳ කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස SLCB හි දායකත්වය.

### අලෙවිකරණය, ප්‍රවර්ධන සහ ප්‍රචාරය

- විදේශ ප්‍රවර්ධන
- SATTE සංචාරක ප්‍රදර්ශන සඳහා සහභාගිත්වය
- MEEDEX 2015 සඳහා සහභාගි වීම
- චීනයේ පැවති IT සහ CM සඳහා සහභාගි වීම
- ඩුබායි හි පැවති ATM සඳහා සහභාගි වීම
- IMEX 2015 සඳහා සහභාගි වීම
- BITE 2015 සඳහා සහභාගි වීම
- හයිද්‍රාබාද්හි පැවති ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන
- චීනයේ පැවති CIBTM සඳහා සහභාගි විම
- සිංගප්පූරුවේ පැවති ශ්‍රී ලංකා ප්‍රවර්ධන වැඩසටහන
- බාසිලොනාහි පැවති IBTM පොළ සඳහා සහභාගි වීම
- කන්මින්හි පැවති CITM සඳහා සහභාගී වීම
- හයිද්‍රාබාද්හි පැවති OTM සඳහා සහභාගි වීම
- ප්‍රංශයේ පැවති IFTM හි ප්‍රවර්ධනය කිරීම්
- සැප්තැම්බර් මස PATA සංචාරක වෙළඳපොළ අතරතුර බැංගලෝරයේදී ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම
- වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරය
- ට්‍රැවල් ටෝක්හි දැන්වීම් පළකිරීම-සැප්තැම්බර් කලාපය
- ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය සඳහා මහජන සම්බන්ධතා සහ දැන්වීම් සමාගමක් පත් කිරීම ඇගයීමේ ක්‍රියාවලියට සහභාගි වීම
- ඉන්දියාවේ AMCHAM සමඟ ඒකාබද්ධ ප්‍රවර්ධන සකස් කර අවසන් කිරීම
- බිග් ඉෂූ සහ ලෙෂර් අයිලන්ඩ් සඟරා මඟින් ප්‍රචාරය කිරීම
- TTG MICE වීෂියා මඟින් ප්‍රචාරය කිරීම
- ICCA මඟින් ප්‍රචාරය කිරීම

### මූල්‍ය සහ පරිපාලනය

- SLCB දත්ත සමුදාය සඳහා නව මෘදුකාංග
- 201 අළෙවිකරණ අයවැය සැලසුම්කරණය



# ආර්ථික ඇගයීම

## ආර්ථික බලපෑම සහ වැදගත්කම

2015 වර්ෂය අවසානය දක්වා ශ්‍රී ලංකාවේ MICE කර්මාන්තය, අන්තර්ජාතික ක්‍රියාකාරකම්වලින් ඇමෙරිකන් ඩොලර් 167,632,715 ක ඉහළ ප්‍රමාණයක් උත්පාදනය කිරීම සමඟින් ඇමෙරිකන් ඩොලර් මිලියන 525ක කර්මාන්තයක් කරා වර්ධනය වී ඇත. සාමයේ ප්‍රතිඵල නෙලා ගනිමින් කර්මාන්තය, විශේෂයෙන් අන්තර්ජාතික රැස්වීම්, සම්මන්ත්‍රණ, දිරිගැන්වීම් සහ ප්‍රදර්ශන අංශය 2009 වර්ෂයේ සිට කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වර්ෂයෙන් වර්ෂයට අන්තර්ජාතික සහ ජාතික MICE ක්‍රියාකාරකම්වල සීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇත. අන්තර්ජාතික ක්‍රියාකාරකම් සංඛ්‍යාව, ජාතික/දේශීය ක්‍රියාකාරකම් සංඛ්‍යාවට සාපේක්ෂව අඩු වුවද, විදේශ විනිමය උපයාගැනීම හේතුවෙන් ආදායමෙහි සැළකිය යුතු කොටසක් (94%) අන්තර්ජාතික MICE මඟින් උත්පාදනය කර ඇත.

අධ්‍යයන සොයාගැනීම්වලට අනුව, 2015 වර්ෂය තුළදී අන්තර්ජාතික පැමිණීම් සංඛ්‍යාව 168,644 ක් වූ අතර එය සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ජාතික/දේශීය සහ අන්තර්ජාතික ක්‍රියාකාරකම් සඳහා සහභාගි වූ මුළු MICE සහභාගිවන්නන් සංඛ්‍යාවෙන් ආසන්න වශයෙන් 9%ක් විය.

ඉහළ යන MICE පැමිණීම් සංඛ්‍යාව සළකා බැලීමෙන් ධනාත්මක පිරිඉතිරීයෑමේ බලපෑම ඇතුළුව MICE හි සමස්ත ප්‍රතිලාභ නිශ්චය කිරීම සඳහා සැටලයිට් ගිණුම්කරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීම සඳහා SLCB සූදානමින් සිටී. එතෙක්, අමුත්තන් විසින් වැඩිපුර වියදම් කිරීම, නැවත නැවත යෙදෙන නිවාඩු, ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සහ වෙනත් වෙළඳ සහ ආයෝජනය සඳහා සම්බන්ධතාවය MICE ප්‍රතිලාභවලට ඇතුලත් වේ.

# හැඳින්වීම

සංචාරක ප්‍රවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ මඟපෙන්වීමෙන් ගෝලීය වෙළඳපොළේ බොහෝදෙනෙකුට ප්‍රිය වූ MICE ආයතනයක් ලෙස ශ්‍රී ලංකාව සඳහා අවස්ථාවන් ඉහළ නැංවීමේ සහ තෝරගැනීම උදෙසා SLCB එහි කාර්යයන් 2015 වර්ෂය තුළදී සිදු කරගෙන ගොස් ඇත. දර්ශනය වඩාත් ධනාත්මක තත්ත්වයක පවතී. කර්මාන්තය, ශ්‍රී ලංකන් ගුවන් සේවාව සහ ශ්‍රී ලංකාවේ MICE සංචාරක කර්මාන්තය සමඟ සම්බන්ධිත වෙනත් සියළු ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම, කාර්යාංශයේ ක්‍රියාකාරකම්වලට ඇතුලත් වන අතර සියළු පාර්ශවයන් සමඟ සහයෝගීව කටයුතු කිරීමේ එහි ප්‍රධාන කාර්යභාරය අඛණ්ඩව සිදු කරගෙන ගොස් ඇත.

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ දැක්ම

"MICE සංචාරක කර්මාන්තය (රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ ක්‍රියාකාරකම්) සඳහා ආසියාවේ වඩාත් ප්‍රිය වූ ස්ථානය ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම”

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මෙහෙවර

MICE සංචරණය හා ක්‍රියාකරකම් තුළින් විශාල විදේශ විනිමයක් ඉපැයීම සහ ඒ තුළින් ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දීම ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මෙහෙවර වේ. තවද ශ්‍රී ලංකා සංචරණය තුල රැස්වීම් කර්මාන්තය තුල රැඳෙන සමස්ථ MICE සංචරණයේ ප්‍රමිති හා තත්ව පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම අප මෙහෙවරෙහි ඒකායන පරමාර්ථයක් වේ.

### 2015 MICE පැමිණීම් (ආසන්න වශයෙන්)

| | පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව | MICE පැමිණීම් | |
|---|---|---|---|
| ජනවාරි | 156,246 | 9.2% | 14,374 |
| පෙබරවාරි | 165 541 | 9.8% | 16,223 |
| මාර්තු | 157,051 | 9.1% | 14,291 |
| අප්‍රේල් | 122,217 | 9% | 10,999 |
| මැයි | 113,529 | 10.8% | 12,261 |
| ජූනි | 115,467 | 10.7% | 12,355 |
| ජූලි | 175,804 | 8.7 | 15,294 |
| අගෝස්තු | 166,610 | 9.1% | 15,162 |
| සැප්තැම්බර් | 143,374 | 9% | 12,903 |
| ඔක්තෝබර් | 132,280 | 10.3% | 14,767 |
| නොවැම්බර් | 144,147 | 9% | 13,117 |
| දෙසැම්බර් | 206,114 | 8.2% | 16,901 |
| **එකතුව 2015** | **1,798,380** | | **168,644** |

මූලාශ්‍රය: 2015 වර්ෂයේදී පර්යේෂණාත්මක තහවුරු කිරීමට යටත් SLCB නිල නොවන MICE දත්ත

2006 වර්ෂයෙ සිට MICE පැමිණීම් සහ ප්‍රක්ෂේපණය




මූලාශය: 2015 වර්ෂයේදී පර්යේෂණාත්මක තහවුරු කිරීමට යටතේ SLCB නිල නොවන MICE දත්ත

## 2. උපදේශන - සහයෝගිත්ව - සම්බන්ධීකරණ (සාමාන්‍ය ක්‍රියාකාරකම්)

කුඩා විශේෂිත වෙළඳපොළක් වන MICE (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ ක්‍රියාකාරකම්) සමඟ කටයුතු කිරීම SLCB හි කාර්යභාරය වන අතර එහි උපාය මාර්ග සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ගවලට වඩා වෙනස් වේ. කාර්යාංශය විසින් සිදු කරනු ලබන කාර්යයන් සංචාරක පනතෙහි දක්වා ඇති අරමුණු පදනම් කර ගත් උපාය මාර්ග හතරක් යටතේ පුළුල්ව වර්ගීකරණය කළ හැක. මෙම උපාය මාර්ග පර්යේෂණ, පුහුණු, අලෙවිකරණය සහ හතරවැනි උපාය මාර්ග වන්නේ මුලින් සාමාන්‍ය ක්‍රියාකාරකම් ලෙස සඳහන් කරන ලද උපදේශන, සහයෝගිත්ව සහ සම්බන්ධීකරණයෙහි කර්මාන්තයෙහි SLCB හි කාර්යභාරය මඟින් ආවරණය වේ.

ලංසුකරණයේදී, උපදේශනයේදී, සැලසුම්කරණයේදී, සංවිධානය කිරීමේදී, ක්‍රියාවට නැංවීමේදී මෙන්ම MICE ක්‍රියාකාරකම් සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ රජයේ නියෝජිතායතනය ලෙස සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සඳහා අගය එකතු කිරීමේදී කර්මාන්තයට සහාය වීමද SLCB හි විශේෂිත කාර්යයන්වලට අයත් වේ.

ඉහත සඳහන් එක් අදියරකදී හෝ අදියර කිහිපයකදී SLCB විසින් සිදු කරන ලද සාමාන්‍ය ක්‍රියාකාරකම් (උපදේශනය, සහයෝගිත්වය සහ සම්බන්ධීකරණය) කිහිපයක් පහත දක්වා ඇති අතර ජාතික වැදගත්කමක් ඇති ප්‍රධාන සිදුවීම් කිහිපයක්ද ඇතුලත් වී ඇත.

### 2.1 SNAV පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ ලංසුවෙහි විධිමත් ඉදිරිපත් කිරීම

SNAV (සින්ඩිකැට් නැෂනල් දෙස් එජන්ට්ස් වොයේජර්ස්-ප්‍රංශයේ ජාතික සංචාරක නියෝජිතයන්ගේ සංගමය) සම්මේලනය 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ ලංසුව SLCB විසින් SNAV සභාපති ජීන් පියරි මාස් මහතාට විධිමත්ව ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

රජයේ නිලධාරින් සහ කර්මාන්ත සාමාජිකයන්ගෙන් සමන්විත ලංසුකරණ කණ්ඩායමෙහි නායකත්වය සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දරන ලදී. ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති තිලක් රණවිරාජා මහතා වෙළඳ සහ වාණිජ දෙපාර්තමේන්තුව සමඟ තානාපති කාර්යාලයේ සම්පූර්ණ සහයෝගය ලබා දෙමින් ශ්‍රී ලාංකික කණ්ඩායමට එක් විය. SNAV නියෝජිත පිරිස මහත් හරසරින් පිළිගෙන පාරම්පරික නැට්ටුවන් විසන් ශ්‍රී ලංකා මණ්ඩපය වෙත කැඳවාගෙන යන ලදී.



නියෝජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා සමඟ ලංසුකරණ කණ්ඩායම




නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් විධිමත් ලංසුව භාර දීම

## 2.1 2016 SNAV සම්මේලනය ශ්‍රී ලංකාවේදී පැවැත්වීම පිළිබඳ මාධ්‍ය හමුව



සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ වැඩබලන සභාපති පැඩී විතාන මහතා, සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ජානය සුගතදාස මහතා සහ කොනැයිසන්ස් ඩි සිලොන් ප්‍රවිනි චන්ද්‍රා වික්‍රමසිංහ මිය, ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ ප්‍රවිනි විපුල වනිගසේකර මහතා මාධ්‍ය හමුවේදී

SNAV 2016 සම්මේලනය ශ්‍රී ලංකාව විසින් ලබා ගත් අතර දිවයිනෙහි සංචාරක කර්මාන්තයේ සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස සඳහන් කළ හැක.

SNAV සම්මේලනය ශ්‍රී ලංකාවට ගෙන ඒම සඳහා වූ නිල මෙහෙයුම, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සාමාජිකයන්, ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ප්‍රංශයේදී පවත්වන ලද අතර සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශ්‍ය, කර්මාන්ත අධිකාරින් සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවය විසින් සහයෝගය දක්වන ලදී.

නොවැම්බර් 18 වැන දින ප්‍රංශයේ, මාර්සේල්ස් හි පවත්වනු ලබන SNAV වාර්ෂික මහා සභා රැස්වීමේදී,˜හ්ඨ සම්මේලනයෙහි සත්කාරක රාජ්‍යය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීම පීළිබඳ නිල දැනුම්දීම සිදු කරනු ඇත. දී.

## 2.3 PATA ලෝක සම්මේලනය ශ්‍රී ලංකාවේදී පැවැත්වීම

පැසිපික් ඒෂියා සංචාරක සංගමයේ වාර්ෂික සම්මේලනය 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ප්‍රදානය කිරීම PATA Ceo විසින් බැංගලෝරයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

PATA හි ප්‍රධාන විධායක නිලධාරි මාරියෝ හාර්ඩි මහතා විසින් මෙම දැනුම්දීම ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවය විසින් සත්කාරකත්වය දක්වන ලද බැංගලෝරයේ විවන්ත බයි ටාජ් හි පැවති ප්‍රධාන උත්සවයකදී සිදු කරන ලද අතර එහිදී බැංගලෝරයේ පැවති PATA ට්‍රැවල් මාර්ට් සඳහා සහභාගී වූ PATA හි සත්කාරක ගැනුම්කරුවන් මෙන්ම සියයකට වඩා වැඩි ඉන්දියානු සංචාරක සහ MICE ගැනුම්කරුවන් සඳහා ශ්‍රී ලංකාව, ආසියාවේ නවතම සංචාරක සහ MICE සංචාරක ගමනාන්තය ලෙස ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සභාපති අජිත් ඩයස් මහතා, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති විපුල වනිගසේකර මහතා, ශ්‍රී ලංකන් ඉන්බවුන්ඩ් ටුවර් ඔපරේෂන් ඇසෝසියේෂන්හි සභාපති මහේන් කාරියවසම් මහතා සහ ශ්‍රී ලංකා වෘත්තීය සම්මේලන සහ ප්‍රදර්ශන සංවිධායකයන් (SLAPCEO) හි සාමාජිකයන්, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, SLCB සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත ඉහළ අධිකාරි බලයක් සහිත කණ්ඩායමක් මෙම අවස්ථාවට සහභාගී විය. පැඩී පෝල් මහත්මිය සහ කර්මාන්ත සමාජිකයන් SLAPCEO නියෝජනය කරන ලද අතර මෙම අවස්ථාවේදී ඔවුන් විසින් ගැනුම්කරුවන් විශාල සංඛ්‍යාවක් හමුවන ලදී.






ප්‍රධාන මේසය - SLAITO හි හිටපු සභාපති මහේන් කාරියවසම් මහතා, PATA ප්‍රවිනි මාරියෝ හාඩි මහතා, SLCB සභාපති විපුල වනිගසේකර මහතා, ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ යභාපති අජිත් ඩයස් මහතා, ඉන්දියාවේ සංචාරක අමාත්‍ය ශ්‍රී දේශ්පාණ්ඩේ මහතා, PATA සභාපති කෙවින් මර්පි මහතා

## 2.4 ශ්‍රෙයා ගොහාල්ගේ ශ්‍රී ලංකා සංචාරය, 2015 මාර්තු

ශ්‍රී ලංකාවට ඇති මෙම අවස්ථාවේ වැදගත්කම පිළිබඳව අවබෝධ කර ගනිමින්, මෙම වර්ෂයේ මාර්තු මස ශ්‍රී ලංකාවට පැමිණි මෙම ගෝලීය සන්නාමධාරිනියගේ මාධ්‍ය හමුව සහ ශ්‍රී ලංකාව තුළ සංචාරය කිරීම සඳහා SLCB එහි පූර්ණ සහාය ලබා දෙන ලදී.



පින්නවල අලි අනාථාගාරයට පැමිණි අවස්ථාව




හිල්ටන් හෝටලයේදී පැවති SLCB මාධ්‍ය හමුව

ශ්‍රෙයා ගොහාල්ගේ සංචාරයේ ප්‍රතිඵලයක් ලෙස පින්නවල අලි අනාථගාරය, රසිකයන් මිලියන 30ක් පමණ සිටින ඇයගේ ෆෙස්බුක් ගිණුමේ ඇතුලත් වී ඇති අතර සංචාරක කර්මාන්තය අතින් බැලූ විට ඉන්දියානු ඒකාබද්ධ රැස්වීම් සහ දිරිගැන්වීම් චාරිකා සඳහා ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා ඉන් සැළකිය යුතු අනුබලයක් ලැබුනු බවට සැකයක් නොමැත.

මාර්තු මස 28 වැනි දින ශ්‍රෙයා ගොහාල් ඇයගේ ජනප්‍රිය ගීතවලින් ඇයගේ රසිකයින් දහසක් පමණ දෙනා පිනවමින් හැව්ලොක් පිටියේදී ප්‍රසංගයක් පවත්වන ලදී.

## 2.5 2015 MICE සංචාරක වෙළඳපොළ

2005 අංක 38 දරන සංචාරක පනත අනුව සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ SLCB හි විධිනියෝගය සමඟ අනුගත වෙමින්, MICE සංචාරක කර්මාන්තය (රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ අවස්ථා) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා 2015 ජූනි මස MICE ගැනුම්කරුවන් සහ සංචාරක ලේඛකයන් 40 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලද වැඩමුළුව සාර්ථක කර ගැනීමට SLAPCEO සහ ශ්‍රී ලංකා සංචාරක හෝටල් සංගමය, ශ්‍රී ලංකාව තුළ සංචාරක සංවිධායකයන්, සංගම් සහ කුඩා සහ මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යවසායන් ඇතුළු සියළු කර්මාන්ත සාමාජිකයන් සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ SLCB සහයෝගිත්වයෙන් වැඩ කටයුතු සිදු කරන ලදී.






2.6 **2015 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත APICTA සම්මාන සහ සම්බන්ධිත ක්‍රියාකාරකම් සඳහා SLCB සහයෝගය ලබා දෙන ලදී.**




SLCB ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි අචිනි දන්දුනගේ මෙය APICTA නිලධාරීන් සමඟ

2.7 **චීනයෙන් බෞද්ධ වන්දනා සංචාර ප්‍රවර්ධනය කිරීම සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකුව සිටි පූජ්‍ය බෙන් සින්ග් හිමියන් විසින් නායකත්වය දෙන ලද චීනයේ බෞද්ධ සංගමයේ සහ ෆුජියාන් පළාතේ නියෝජිත පිරිස සමඟ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය 2015 අප්‍රේල් මාසයේදී සිදු කළ හමුව**



SLCB Ceo විපුල වනිගසේකර මහතා SLTPB හි අධ්‍යක්ෂ/අළෙවිකරණ මදුභානි පෙරේරා මහත්මිය සමඟ රැස්ව සිටින්නන් ඇමතීම



ආධ්‍යාත්මිකතාවයෙහි වර්තමාන තත්ත්වය ආවරණය කරමින් කෙටි දේශනයක් සිදු කළ අතර සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ අළෙවිකරණ අධ්‍යක්ෂ මධුභානි පෙරේරා මහත්මිය විසින් චීනයෙන් සිදු කරන සංචාර දියුණු කිරීමේ සැලසුම් පැහැදිලි කරන ලදී.

ශ්‍රී ලංකාව චීන සංචාර ඉතා වේගයෙන් ප්‍රවර්ධනය කරමින් සිටින අවස්ථාවක මෙවැනි සංචාර ප්‍රවර්ධනය කිරීම සඳහා උසස් සහ ඉහළ පරිමාණයේ කොටසක් වීම වඩාත් උනන්දු කරවන ස්වභාවයක් ගනී.තවද අපට ඉදිරි වර්ෂයේදී චීනයෙන් බෞද්ධ සම්මන්ත්‍රණ කිහිපයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි' SLCB හි Ceo විපුල වනිගසේකර මහතා පැවසීය.

2.8 **20 වැනි අන්තර්ජාතික මූල්‍ය ගුප්තලේඛන සංගමය (IFCA) 2016.**



ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ගයාන් පීරිස් මහතා , IFCA සම්බන්ධීකාරක රෆායල් හර්ෂ්ෆෙල්ඩ් මහතා, හි විපුල වනිගසේකර මහතා සහ කුමුදු හැන්නදිගේ මහත්මිය

2016 වර්ෂයේ IFCA (අන්තර්ජාතික මූල්‍ය ගුප්ත ලේඛන සංගමය) අන්තර්ජාතික සම්මන්ත්‍රණය සඳහා සාර්ථක ලංසුවක් සකස් කිරීම පිණිස ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය, මෙම සම්මන්ත්‍රණයේ සම්බන්ධීකාරක රෆායල් හර්ෂ්ෆෙල්ඩ් මහතාට ස්ථාන පරීක්ෂාවක් සඳහා ආරාධනා කරන ලදී. පසුගිය වර්ෂයේ ෆ්රැන්ක්ෆර්ට් හි පැවති IMEX සඳහා SLCB සහභාගි වූ අවස්ථාවේදී මේ සඳහා සම්බන්ධතාවය ඇති විය. සම්මන්ත්‍රණය 2014 වර්ෂයේදී බාබඩෝස්වලදී පවත්වන ලද අතර මෙම වර්ෂයේදී එය පුවර්ටෝ රිකෝහිදී ජනවාරි මස පවත්වන ලදී. මෙය ගෞරවාන්විත අවස්ථාවක් වන අතර සතියක සම්මන්ත්‍රණ කාල සීමාව සාමාන්‍යයෙන් ජනවාරි/පෙබරවාරි මාසයේදී පැවැත්වේ. නියෝජිතයන් සංඛ්‍යාව මූල්‍ය ආරක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළ වෘත්තිකයන් 150ක් පමණ වේ.

2.9 **ජල සම්පත් සහ පරිසරය පිළිබඳ දෘෂ්ටිකෝණය පිළිබඳ 8 වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය (IPWE) 2016 ශ්‍රී ලංකාවේ පැවැත්වීමට හැකියාව ලබා ගනී**

අන්තර්ජාතිකව වැදගත් තවත් සම්මන්ත්‍රණයක් වන ඇමෙරිකානු සිවිල් ඉංජිනේරුවරුන්ගේ සමාජයෙහි පරිසර සම්පත් ආයතනය (ASCE-EWRI) විසින් සත්කාරකත්වය දක්වන "ජල සම්පත් සහ පරිසරය පිළිබඳ දෘෂ්ටිකෝණය පිළිබඳ 8 වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය (IPWE) - 2016" 2016 වර්ෂයේ ජනවාරි මස 4 සිට 6 දක්වා කොළඹ, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පවත්වන බව SLCB දන්වා සිටී.

2.10 **නයිජල් බාකර්ගේ ශ්‍රී ලංකා සංචාරයට SLCB සහාය දක්වීම**

ජූලි 15-23 දක්වා අන්තර්ජාතිකව පිළිගත් ඡායාරූප ශිල්පියෙක් වන නයිජල් බාකර්ගේ ශ්‍රී ලංකා සංචාරයට සත්කාරකත්වය දැක්වීම සඳහා SLCB එහි පූර්ණ සහාය දක්වන ලදී. ඔහුගේ සංචාරය අතරතුර මෙම කීර්තිමත් ඡායාරූප ශිල්පියා, තත්‍ය රූපවාහිනි වැඩසටහන් ඉදිරිපත් කරන්නා, ගත් කතුවරයා සහ නිරූපන ශිල්පියා විසින් විලාසිතා කර්මාන්තය, ඡායාරූපකරණය සහ ප්‍රබෝධමත්භාවය පිළිබඳව වැඩමුළුවක් පවත්වන ලදී.



**2.11 SLCB සහාය සමඟ ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයෙහි (ICSE 2015) (http://ssesl2015.org) වෙබ් අඩවිය දියත් කිරීම සහ මාධ්‍ය හමුව**

ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගේ සංගමය (SSE-SL) මෙම වර්ෂයේ දී ඔවුන්ගේ රිදී ජුබිලිය සැමරීමට කටයුතු කරමින් සිටී. එහි සැමරීම්වල කොටසක් ලෙස එම සංගමය අගෝස්තු 24 සිට 26 දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ ඕක් කාමරයේදී (බෝල්රූම්) අන්තර්ජාතික සම්මන්ත්‍රණයක් සංවිධානය කර ඇත.

සම්මන්ත්‍රණය සඳහා මාධ්‍ය හමුව සහ වෙබ් අඩවිය දියත් කිරීම SLCB හි සහාය ඇතිව ජූලි 23 වැනි දින SLITHM හිදී පවත්වන ලදී.



**2.12 ලංකා චැලෙන්ජ් 2015 -ත්‍රිරෝද රථ පෙළපාළිය"ලංකා චැලෙන්ජ්" මාධ්‍ය හමුව**




SLCB හි සහාය ඇතිව ජූලි 23 වැනි දින SLITHM හිදී පවත්වන ලද ලංකා චැලෙන්ජ් මාධ්‍ය හමුව



''ලංකා චැලෙන්ජ්'' හි 7 වැනි සංස්කරණය දේශීය ප්‍රවාහනයේ ප්‍රියතම ආකාරය වන ත්‍රිරෝද රථවලින් ශ්‍රී ලංකාව වටා දින 11ක සංචාරය-2015 සැප්තැම්බර් මස 04 සිට 11 දක්වා සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ සහාය යටතේ පවත්වන ලදී.

ලාර්ජ් මයිනෝරිටි විසින් 7 වැනි වරටත් සංවිධානය කරන ලද 2015 චැලෙන්ජ් වැඩසටහන සඳහා අන්තර්ජාතික සහභාගිවන්නන් 35 දෙනෙකුගෙන් සමන්විත වූ කණ්ඩායම් 15ක් ලියාපදිංචි විය.

**2.13 LSR මැරතන් තරඟය - මාධ්‍ය හමුව**




SLCB හි සහාය ඇතිව SLITHM හිදී පවත්වන ලද කලම්බු මැරතන් මාධ්‍ය හමුව

2015 ඔක්තෝබර් මස 04 වැනි දින පවත්වන ලද කලම්බු මැරතන් ලෙස ප්‍රසිද්ධියට පත් වී ඇති 15 වැනි LSR කලම්බු මැරතන් තරඟය සඳහා SLCB සහයෝගය දක්වන ලදී. බාධක මධ්‍යයේ පසුගිය වර්ෂ කිහිපය තුළදී LSR කලම්බු මැරතන් තරඟය පවත්වා ඇත. මෙම වර්ෂයේදී දකුණු ඇමෙරිකාව හැර සියළු මහද්වීප ආවරණය කරමින් රටවල් 29ක විදේශ ධාවකයන් 200ක් ඇතුළුව සහභාගී වූ ධාවකයන් සංඛ්‍යාව 5,500ක් පමණ විය.

**2.14 SLCB, චීන සංචාරක නියෝජිතයන් පිරිසකට ශ්‍රී ලංකාව සත්කාරකත්වය දක්වයි**

ශ්‍රී ලංකන් ගුවන් සේවය සමඟ එක්ව SLCB චීන සංචාරක නියෝජිතයන් කණ්ඩායමකට සත්කාරකත්වය දක්වන ලදී. MICE පහසුකම් ඇතුලත්ව ශ්‍රී ලංකාවේ ස්ථාන සහ සිත් ඇදගන්නා අංග බොහොමයක් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී.



SLCB සාමාන්‍යාධිකාරී විපුල වනිගසේකර මහතා නියෝජිත පිරිසට ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කරමින්



B2B සැසිවාරය පැවැත්වෙමින්

සංචාරය අවසානයේදී කොළඹ SLITHM හිදී කණ්ඩායම සඳහා B2B සැසිවාරය පවත්වන ලදී.

### 2.15 රෙඩ් බුල් කාර්ට් ෆයිට් 2015

නොවැම්බර් මස 28 සහ 29 දිනවල SLCB සහයෝගය යටතේ මීරිගම කැන්වේ ඔටෝඩ්‍රෝම්හිදී පවත්වන ලද රෙඩ් බුල් කාට් ෆයිට් 2015




SLCB අළෙවිකරණ සහ ප්‍රවර්ධන කළමනාකාරිනි කුමුදු හැන්නදිගේ මෙය රෙඩ් බුල් කාට් ෆයිට් 2015 හිදී

MICE සම්බන්ධිත ක්‍රියාකාරකම් සඳහා සහාය ලබාදෙන ලද අවස්ථාවන් සහ SLCB ට සහභාගිවීමට ලැබුනු හෝ නැවත ලංකාවට පැමිණීම සඳහා ඔවුන් උනන්දු කරමින් ඉදිරිපත් කිරීම් සිදු කිරීමට හැකි වූ අවස්ථා



| මාසය | දිනය | දේශීය සිදුවීම් සංවිධායක | සිදුවීම |
|---|---|---|---|
| ජනවාරි | 28 ජනවාරි - 2 පෙබ-රවාරි | නිර්වින්දන වෛද්‍ය විද්‍යාලයේ ශ්‍රී ලංකා විද්‍යා පීඨය | ශ්‍රී ලංකාවේ නිර්වින්දන විද්‍යාඥයින්ගේ විද්‍යාලයේ වාර්ෂික විද්‍යාත්මක සැසිවාර 31 ක් |
| පෙබරවාරි | 3-9 පෙබරවාරි | එයිට්කන් ස්පෙන්ස් | කේසිරි ගෲප් - ඉන්දියා |
| පෙබරවාරි | 19-21 පෙබරවාරි | ශ්‍රී ලංකා විද්‍යාඥයින්ගේ සංගමය | 24 වන ලංකා ඩර්මා වාර්ෂික අනුස්මරණ සැසිය හා ජර්මානු මානසික විද්‍යාව සමඟ ඒකාබද්ධ රැස්වීමක් |
| පෙබරවාරි | 21- පෙබරවාරි | ශ්‍රී ලංකා දන්ත වෘත්තිකයන්ගේ ආයතනය | ශ්‍රී ලංකාවේ සාමාන්‍ය දන්ත වෛද්‍ය ශිල්පීන්ගේ වාර්ෂික සැසිය |
| මාර්තු | 27-30 මාර්තු | ශ්‍රී ලංකා මානසික විද්‍යායතනය | ශ්‍රී ලංකාවේ මනෝ චිකිත්සකයන්ගේ ශ්‍රී ලංකා විද්‍යාතනය 2015 |
| අප්‍රේල් | 3-5 අප්‍රේල් | ජෙට්වින් ට්‍රැවල්ස් | විනී කොස්මැටික්ස් - ශ්‍රී ලංකාවේ සංචාරය |
| අප්‍රේල් | 14- අප්‍රේල් | ජෙට්වින් ට්‍රැවල්ස් | ටාටා හිතාචි - |
| අප්‍රේල් | 25-27 අප්‍රේල් | හෙලන්කා වැකේෂන් | ෆෝර්ස් කොන්ග්‍රසය |
| මැයි | 06-08 මැයි | ශ්‍රී ලංකා කළමණාකරුවන්ගේ ආයතනය | ඒ.ඒ.ම්.ඕ. රැස්වීම |
| මැයි | 7-මැයි | එම්. පී. ඉවෙන්ට්ස් ලංකා පුද්ගලික සමාගම | 9 වන ඉන්දියානු වෙළඳ ප්‍රදර්ශනය |
| මැයි | 08-12 මැයි | රෝයල් හොලිඩේ | |
| මැයි | 10-16 මැයි | ජෙට්වින් ට්‍රැවල්ස් | 3වැනි ඉන්දියා කණ්ඩායම් සම්මන්ත්‍රණය |
| මැයි | 22-24 මැයි | ශ්‍රී ලංකා ටොස්මස්ටර්ස් ජාත්‍යන්තරය | ජාත්‍යන්තර ටොස්මස්ටර්ස් දිස්ත්‍රික් සහ සම්මන්ත්‍රණය |
| ජුනි | 1-5 ජුනි | ජෙට්වින් ට්‍රැවල්ස් | ජාත්‍යන්තර වෙළඳ සම්මුතිය 2015 |
| ජුනි | 12-13 ජුනි | ශ්‍රී ලංකා හදවත් සංගමය | |
| ජුනි | 12-14 ජුනි | - | කන්ස්ට්‍රක්ෂන් එක්ස්පෝ 2015 |
| ජුනි | 12-21 ජුනි | අනුකූලතා තක්සේරු කිරීමේ ශ්‍රී ලංකා ප්‍රසාරනය කිරීමේ මණ්-ඩලය | ඒ.පී.එල්.සී - පී.ඒ.සී. සම්බන්ධ වාර්ෂික රැස්වීම 2015 |
| ජුනි | 17-20 ජුනි | ජෙට්වින් ට්‍රැවල්ස් | මහින්ද්‍රා ගෲප් ටුවර් |
| ජූලි | 3-5 ජූලි | ශ්‍රී ලංකා ජාතික දැව සංස්ථාව | ආයුර්වේද එක්ස්පෝ 2015 |
| ජූලි | 5-8 ජූලි | ශ්‍රී ලංකා සෞඛ්‍ය සමාජය | 128 වන ජාත්‍යන්තර වෛද්‍ය කොන්ග්‍රසය එස්.එල්.එම්.ඒ. |
| ජූලි | 9-12 ජූලි | මොරටුව විශ්ව විද්‍යාලය | අයි.ඊ.ඊ.ඊ |
| ජූලි | 15- ජූලි | සිනමන් හොටෙල් මැනේජ්මන්ට් පුද්ගලික ආයතනය | නයිජල් බාර්කර් ශ්‍රී ලංකාවට පැමිණීම. |
| ජූලි | 16-18 ජූලි | ශ්‍රී ලංකා හදවත් සංගමය | ශ්‍රී ලංකා හෘද සංගමය සම්බන්ධ අධ්‍යන සමුළුව |
| ජූලි | 18-22 ජූලි | යාත්‍රා ට්‍රැවල්ස් | |
| ජූලි | 19- ජූලි | ඒශියන් ස්කේප්ස් | HDFC බැංකු ඉන්දියානු කණ්ඩායම් සංචාරය |
| ජූලි | 30- ජූලි - 2 අගෝස්තු | ශ්‍රී ලංකා ළමා රෝග විද්‍යාලය | දකුණු ආසියා ළමා සායන සංගමයේ දෙවන සමුළුව සහ 18 වන වාර්ෂික විද්‍යාත්මක සම්මේලන |
| අගෝස්තු | 7-9 අගෝස්තු | LECS | ප්‍රණීත ආහාර ඇසුරුම් හා කෘෂි ව්‍යාපාර |
| අගෝස්තු | 10-11 අගෝස්තු | ශ්‍රී ලංකා භූ තාක්ෂණ සමාජය | ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - අයි.සී.ජී.ඊ. කොළඹ 2015 |

| | | | |
|---|---|---|---|
| අගෝස්තු | 10-12 අගෝස්තු | මොරටුව විශ්ව විද්‍යාලය | මහාමාර්ග ඉංජිනේරු හා ප්‍රවාහනපද්ධතිවල දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව(ICA-HETS) |
| අගෝස්තු | 18-19 අගෝස්තු | ඕ.පී.ඒ | ඕ.පී.ඒ. වාර්ෂික සමුළුව 2015 |
| අගෝස්තු | 19 අගෝස්තු | ශ්‍රී ලංකාවේ ආශ්චර්යයන් පිළිබඳ විද්‍යාලය | ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍යවරුන්ගේ වාර්ෂික අධ්‍යන සැසිවාරය - 2015 |
| අගෝස්තු | 20-23 අගෝස්තු | වෝල්කර්ස් ට්‍රවර්ස් | වැල්වොලයින් මයිස් ගෘප් |
| අගෝස්තු | 21-30 අගෝස්තු | ඇලොන්ෆ්‍රැන්සිස් ද කෝට්ටේ, බ්‍රිතාන්‍ය කවුන්සිලය | කොළම්බෝ ස්කෝප් 2015 |
| අගෝස්තු | 24-25 අගෝස්තු | කොළඹ විශ්වවිද්‍යාලය, පරිගණක හැදෑරීමේ පාසල | ICT 2015 |
| අගෝස්තු | 28-30 අගෝස්තු | කොළඹ පර්යේෂණ හා මනෝ විද්‍යායතනය | ව්‍යවහාරික මනෝ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව |
| සැප්තැම්බර් | 2-4 සැප්තැම්බර් | TIIKM | නැනෝ සිටි විද්‍යාව සහ නැනෝ තාක්ෂණ විද්‍යාව පිළිබඳ දෙවන ජාත්‍යන්තර සමුළුව 2015 |
| සැප්තැම්බර් | 04-14 සැප්තැම්බර් | කොන්සිසන්ස් ද සිලෝන් | ලංකා අභියෝගය - ත්‍රී රෝද රථ අභියෝගය |
| සැප්තැම්බර් | 7-9 සැප්තැම්බර් | ශ්‍රී ලංකා පරිගණක සංගමය | 33 වන ජාතික තොරතුරු තාක්ෂණ සමුළුව |
| සැප්තැම්බර් | 9- සැප්තැම්බර් | ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ගේ විද්‍යාලය | නර්තන ශිල්පීන්ගේ හා නාට්‍ය ශිල්පීන්ගේ ජාත්‍යන්තර සමුළුව |
| සැප්තැම්බර් | 15-17 සැප්තැම්බර් | හෙළ විද්‍යාඥයින්ගේ ශ්‍රී ලංකා විද්‍යාපීඨය | ශ්‍රී ලංකා විද්‍යාගාරයේ වාර්ෂික අධ්‍යයන සැසිවාරය |
| සැප්තැම්බර් | 19 සැප්තැම්බර් | ටයිම් ඇන්ඩ් ස්පේස් ඇඩ්-වර්ටයිසින්ග් පුද්ගලික ආයතනය | ඇන්කිට් තිවාරි ප්‍රසංගය |
| සැප්තැම්බර් | 24-26 සැප්තැම්බර් | හෙළන්කා වැකේෂන් | කොළඹ ජාත්‍යන්තර සමුද්‍ර සමුළුව |
| සැප්තැම්බර් | 25- සැප්තැම්බර් | කොළඹ විශ්වවිද්‍යාල වාණිජ දෙපාර්තමේන්තුව | සංචාරක දින සැමරුම 2015 |
| සැප්තැම්බර් | 28- සැප්තැම්බර් | සිනමන් හොටෙල් | සංචාරක සමුළුවේ අනාගතය |
| ඔක්තෝබර් | 3-7 ඔක්තෝබර් | මානසික ආබාධ සඳහා වූ ලංකා සංගමය | බුද්ධිමය ආබාධ පිළිබඳ ආසියානු සම්මේලනයේ 22 වන සමුළුව |
| ඔක්තෝබර් | 4- ඔක්තෝබර් | එල් එස් ආර් ට්‍රැවල් | එල් එස් ආර් කොළඹ මැරතන් |
| ඔක්තෝබර් | 6-9 ඔක්තෝබර් | ජෙට්වින් ට්‍රැවල් | |
| ඔක්තෝබර් | 8-10 ඔක්තෝබර් | ඇමෙරිකානු වාණිජ මණ්ඩලය ශ්‍රී ලංකාව | AMCHAM විධායක අධ්‍යක්ෂක සම්මන්ත්‍රණය |
| ඔක්තෝබර් | 10-16 ඔක්තෝබර් | සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට් | නිධන් හෑරීම |
| ඔක්තෝබර් | 11-15 ඔක්තෝබර් | එයිට්කන් ස්පෙන්ස් කාර්ගෝ | ලෝක ගුවන් භාණ්ඩ සංවිධානයේ සම්ම-න්ත්‍රණය |
| ඔක්තෝබර් | 22-27 ඔක්තෝබර් | ජෙට්වින් ට්‍රැවල් | ලෝක ගුවන් භාණ්ඩ සංවිධානයේ සම්ම-න්ත්‍රණය |
| ඔක්තෝබර් | 23-24 ඔක්තෝබර් | ශ්‍රී ලංකා පුෂ්ප විද්‍යාඥයින්ගේ විද්‍යාලය | 7 වන ශ්වසන සම්මේලනය |
| නොවැම්බර් | 1-3 නොවැම්බර් | වනජීවී හා පරිසර ආරක්ෂණ සමාජය - ශ්‍රී ලංකාව | கடந்த கால மற்றும் தற்போதைய தெற்காசிய காட்டுப் பூனைகள் குறித்து கருத்தரங்கு |
| නොවැම්බර් | 3-5 නොවැම්බර් | වාරිමාර්ග අමාත්‍යාංශය | INWEPF symposium 2015 |
| නොවැම්බර් | 4-7 නොවැම්බර් | 150කින් යුත් ඉන්දියානු කණ්-ඩායම | ඩෙට්ලෙම් ට්‍රැවල්ස් |
| නොවැම්බර් | 5-6 නොවැම්බර් | ටී.අයි.අයි.කේ.මි | ආගන්තුක සත්කාරය හා සංචාරක ව්‍යාපාරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2015 |
| නොවැම්බර් | 6-11 නොවැම්බර් | ශ්‍රී ලංකා චිත්‍රපට අධ්‍යක්ෂ-වරුන්ගේ මාර්ගෝපදේශය | |
| නොවැම්බර් | 16-20 නොවැම්බර් | එම්. ඩී. එෆ් ආසියා | සෙගා මීටින් කොළඹ |
| නොවැම්බර් | 16-19 නොවැම්බර් | අනුකූලතා ඇගයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රසස්තිතන මණ්ඩලය | වාර්ෂික ජාත්‍යන්තර ආපදා සම්මේලනය 2015 |
| නොවැම්බර් | 18- නොවැම්බර් | සංචාරක සමාජයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 2015 සංචාරක ගෝල්ඩන් අඩි මුද්‍රණය |
| නොවැම්බර් | 20- නොවැම්බර් | සෙරන්ඩිවිස් ඉන්ටර්නැෂනල් සමාගම | ඇඟලුම්, රෙදිපිළි හා විලාසිතා නිර්මාණක-රණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2015 |
| නොවැම්බර් | 19-21 නොවැම්බර් | එයිට්කන් ස්පෙන්ස් ට්‍රැවල්ස් | CHOVA 2015 |
| දෙසැම්බර් | 1-31 දෙසැම්බර් | බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය | ආසියාවේ උසම නත්තල් ගස ඉදිකිරීම |
| දෙසැම්බර් | 3- දෙසැම්බර් | කොළඹ ආගන්තුක සත්කාර කළමණාකරණ මණ්ඩලය | MICE සඳහා කළමනාකරණ සහභාගිත්වය ඒකාබද්ධ කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය |
| දෙසැම්බර් | 8-12 දෙසැම්බර් | එම්.පි. ජාත්‍යන්තර | ඉන්දියානු මූලාශරය සරබ 2015 |
| දෙසැම්බර් | 10-12 දෙසැම්බර් | සෙරෙන්ඩිවස් ඉන්ටර්නැෂනල් (පීවීටී) | ආයුර්වේදය, සිඩ්ඩා සහ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ 3 වන ජාත්‍යන්තර සමුළුව 2015 |
| දෙසැම්බර් | 11- දෙසැම්බර් | D සම්බන්ධයි | pan-Asia ආසියා කාන්තා ගොවි සංසද - OXFAM විසින් සංවිධානය කරන ලදී |
| දෙසැම්බර් | 11-18 දෙසැම්බර් | ජෙට්වින් ට්‍රැවල්ස් | ඉන්දියාවේ MICE සමූහයේ 900 සාමාජිකයන් |
| දෙසැම්බර් | 15-16 දෙසැම්බර් | ටී.අයි.අයි.කේ.මි | දරිද්‍රතාවය හා තිරසාර සංවර්ධනය පිළිබඳ දෙවන ජාත්‍යන්තර සමුළුව |
| දෙසැම්බර් | 18-23 දෙසැම්බර් | ටැන්ජරින් ටුවර්ස් (පයිවට්) ලිමිටඩ් | සිංගප්පූරු උපදේශන සමාගම - දිරි ගැන්වීමේ කණ්ඩායම් 19 |
| දෙසැම්බර් | 16-19 දෙසැම්බර් | ජෙට්වින් ට්‍රැවල්ස් | ඉන්දියාව MICE කණ්ඩායම 70 පාක් |

## 3. පර්යේෂණ සහ සංවර්ධන

### 3.1 දින 100 වැඩසටහන සඳහා SLCB හි මුලපිරීම්

රජයේ දින 100 වැඩසටහන සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කිරීම සඳහා වූ සංචාරක අමාත්‍යාංශයේ මඟපෙන්වීම් අනුව, දෙන ලද කාලපරිච්ඡේදය සඳහා සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන ලද අභිමතාර්ථ SLCB විසින් ඉදිරිපත් කරන ලද අතර ඒවා සාර්ථකව සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

විශේෂිත ඉලක්කයන්ට තදනන්තර යාවත්කාලීන කිරීම් සිදු කරන ලද අතර ගරු අමාත්‍යතුමා සමඟ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම්වලදී ප්‍රගතිය වාර්තා කරන ලදී.

දින සියයේ වැඩසටහන - ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (SLCB)

| ක්‍රියාකාරකම | ජනවාරි | | | | පෙබරවාරි | | | | මාර්තු | | | | | අප්‍රේල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 වන සතිය | 2 වන සතිය | 3 වන සතිය | 4 වන සතිය | 5 වන සතිය | 6 වන සතිය | 7 වන සතිය | 8 වන සතිය | 9 වන සතිය | 10 වන සතිය | 11 වන සතිය | 12 වන සතිය | 13 වන සතිය | 14 වන සතිය | 15 වන සතිය | 16 වන සතිය | 17 වන සතිය |
| MICE වාර්තා චිත්‍ර පටයකි | | | | | | | | | | | | | | | | | ■ |
| තොරතුරු පත්‍රිකා | | | | | | | | | | | | | | | ■ | | |
| වෙළඳ පොළ සහභාගීත්වය | | | | | ■ | | | | | | | ■ | | | | | |
| පර්යේෂණ සංඛ්‍යාලේඛන සංග්‍රහය | | | | | | | | | | | | | | | | ■ | |
| පර්යේෂණ සංඛ්‍යාලේඛන සංග්‍රහය | | | | | | | | | | | | | | ■ | | | |
| MICE පුහුණු වැඩසටහන | | | | | | | | | | | | ■ | | | | | |
| සිදුවීම් සහාය | | | | ■ | | | | ■ | | | | | ■ | | | | ■ |

### 3.2 2013 පර්යේෂණ සඟරාවේ සංඛ්‍යාලේඛන සකස් කර අවසන් කරන ලද අතර ලේඛනය මුද්‍රණය කිරීම ජුනි මස අවසානය වනවිට සම්පූර්ණ කරන ලදී.

වර්ෂ 6ක් සඳහා පර්යේෂණ සඟරාව සම්පාදනය කර නොමැති සහ MICE කර්මාන්තයේ පාර්ශවකරුවන්ගෙන් දත්ත එක්රැස් කිරීමට දීර්ඝ කාලයක් ගතවූ, සැළකිය යුතු කාලයක් සහ ප්‍රයත්නයක් අවශ්‍ය වූ ක්‍රියාවලියක් වී තිබූ තත්ත්වයක් තුළ මෙය කාර්යාංශයට සැළකිය යුතු ජයග්‍රහණයක් විය.

### 3.3 සංඛ්‍යාලේඛන සඟරාව නැවත දියත් කිරීම

වර්ෂ 06ක ප්‍රමාදයකින් පසුව 2015 ජූලි මාසයේදී පර්යේෂණ අංශය විසින් සංඛ්‍යාලේඛන සඟරාව නැවත නිකුත් කිරීමට සමත් විය. සඟරාව නිකුත් කිරීම සඳහා කර්මාන්ත සාමාජිකයන් සහභාගි වූ අතර ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේදී SLCB හි ප්‍රවීනි විපුල වනිගසේකර මහතා සහ පර්යේෂණ කළමනාකාරිනි ඉරෝමි ජයවර්ධන මෙනවිය විසින් පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කරන ලදී.



*ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ*
*ප්‍රධාන විධායක නිලධාරී විපුල වනිගසේකර*



*ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ*
*කළමණාකරු (පර්යේෂණ) අයෝර්මි ජයවර්ධන*

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ MICE කර්මාන්තය ඉහළ වර්ධන විභවයක් සහිත ඩොලර් මිලියන 177ක කර්මාන්තයක් වන බව සංඛ්‍යාලේඛනවලින් තහවුරු වී ඇත.



3.4 වැඩි පිළිගැනීමක් සඳහා පර්යේෂණ අංශය ICCA සමඟ සමීපව වැඩ කටයුතු කිරීම සිදු කරගෙන ගිය අතර අනාගත ප්‍රතිලාභ සඳහා එහි සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික සම්මන්ත්‍රණ සහ සම්මේලන සංගමය (ICCA) සමඟ 2015 වර්ෂය සඳහා එහි සාමාජිකත්වය අලුත් කිරීමට පියවර ගෙන ඇත. ICCA සමඟ ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය හරහා පමණක් පවත්වාගෙන යනු ලැබේ.

### 3.5 දත්ත සමුදාය

යාවත්කාලීනව සහ වැඩිදියුණු කළ තත්ත්වයක පවත්වා ගැනිම සඳහා දත්ත සමුදාය පිළිසකර කිරීමට කාර්යාංශය පියවර ගන්නා ලදී.

3.6 පර්යේෂණ අංශය ශක්තිමත් කිරීම සමගින් අන්තර්ජාතික සංගම් රැස්වීම් සඳහා ලංසු ඉදිරිපත් කිරීම උදෙසා කාර්යාංශය ව්‍යාපාර ප්‍රමුඛයන් සමඟ සහ සංගම් සමඟ සම්බන්ධ වෙමින් වැඩ කටයුතු සිදු කරගෙන ගොස් ඇත.

3.7 පවතින සම්පත්, කර්මාන්ත තොරතුරු සමඟ යාවත්කාලීන වීම සහ ශ්‍රී ලංකාව විසින් අත්පත් කරගත් අන්තර්ජාතික අවස්ථා සම්බන්ධ යාවත්කාලීන කිරීම් ICCA දත්ත සමුදායට ලබා දීමෙන් ශ්‍රී ලංකාවේ දෘෂ්‍යතාවය ශක්තිමත් කිරීම සහතික කිරීම සඳහා SLCB හි පර්යේෂණ ක්‍රියාකාරකම ICCA සමඟ ශක්තිමත් කතිකාවතක් පවත්වාගැනීම සිදු කරගෙන ගොස් ඇත. 2014 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවති අන්තර්ජාතික අවස්ථා සම්බන්ධයෙන් SLCB විසින් ICCA ට සිදු කරන ලද ඉදිරිපත් කිරීම සහ යවන ලද සහායක දත්ත පදනම් කර ගනිමින්, ICCA ඔවුන්ගේ සබැඳි දත්ත සමුදාය සහ වාර්තා යාවත්කාලීන කර, 2014 වර්ෂයේ අන්තර්ජාතික සිදුවීම් ලැයිස්තුව යටතේ 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති අවස්ථා 30ක් ඇතුලත් කර ඇත. අන්තර්ජාතිකව ප්‍රිය කරන රැස්වීම් ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතිය පිළිබිඹු කරන මෙම තත්ත්වය සැළකිය යුතු ජයග්‍රහණයක් වන අතර අන්තර්ජාතික හඳුනාගත් අවස්ථා සංඛ්‍යාව වැඩි වීම සහ 2013 වර්ෂයේ පැවති සංඛ්‍යාවට (අවස්ථා 17ක් පමණි) වඩා දෙගුණයක් වීම (ICCA වර්ගීකරණය අනුව) මඟින්

| | | මාතෘකාව | පටන් ගත් දිනය | |
|---|---|---|---|---|
| 1 | 201410816 | 7 වන ආසියානු බලශක්ති ආරක්ෂා සමුළුව - AESS | 2014.02.26 | 6029119 |
| 2 | 201410863 | IFFA 4වන අධ්‍යාපන සමුළුව | 2014.03.05 | 6029120 |
| 3 | 201405636 | ජල සම්පත් හා පුනර්ජනනීය සංවර්ධනය පිළිබඳ ආසියා- ASLA 2014 ජාත්‍යන්තර සමුළුව 5 | 2014.03.11 | 6017497 |
| 4 | 201402528 | 21 වන IFLN සාමාජික සමුළුව | 2014.03.23 | 6011351 |
| 5 | 201402576 | | 2014.04.09 | 6023052 |
| 6 | 201410884 | සිවිල් ගුවන් යාත්‍රා සේවා සංවිධානයේ ආසියා පැසිෆික් සම්මේලනය - CANSO | 204.05.05 | 6029136 |
| 7 | 201403167 | ලෝක තරුණ සම්මේලනය 7 | 2014.05.06 | 6013354 |
| 8 | 201410890 | CAPSCA ආසියා පැසිෆික් හි රැස්වීම 7 - CAPSCA - AP ව්‍යාපෘතිය | 2014.05.20 | 6029139 |
| 9 | 201402774 | ගුවන් විදුලි ආසියාවේ 2014 සමුළුව | 2014.05.21 | 6013631 |
| 10 | 201410894 | දකුණු ආසියාතික ඉගැන්වීම් සැසිය 24 - ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ - IHL- | 2014.05.26 | 6029140 |
| 11 | 201406174 | ලෝක ලේ දන් දීමේ දිනය - WBDD 2014 | 2014.06.09 | 6028128 |
| 12 | 201410907 | මානසික ASPAC සම්මේලනය පිළිබඳ රිච්මන්ඩ් අධිශිෂ්‍යත්ව සමුළුවේ සම්මන්ත්‍රණය | 2017.07.27 | 6029148 |
| 13 | 201404957 | 9 APTE-ආසියා පැසිෆික් ප්‍රවාහනය සහ පරිසරය පිළිබඳ සම්මේලනය - APTE- | 2014.08.06 | 6006713 |
| 14 | 201406163 | අරාබියේ සාක් සමුළුවේ 12 වැනි සමුළුව | 2014.09.28 | 6028125 |
| 15 | 201406166 | 9 SAARC ENT සමුළුව | 2014.10.09 | 6021826 |
| 16 | 201400297 | තත්ත්ව පාලන චක්‍ර පිළිබඳ අන්තර්ජාතික සමුළුව - ICQCC 2014 | 2014.10.12 | 6001344 |
| 17 | 201410930 | අප්‍රිකානු - ආසියානු ජනතා සහයෝගී සංවිධානයේ සම්මේලනය - AAP-SO | 2014.10.18 | 6029158 |
| 18 | 201407340 | ග්ලෝබල් රබර් සම්මේලනය - GRC | 2014.10.27 | 6021033 |
| 19 | 201408705 | බ්‍රිතාන්‍ය ජාත්‍යන්තර වෛද්‍යවරුන්ගේ සංගමයේ අන්තර්ජාතික සම්ම-න්ත්‍රණය - BIDA | 2014.11.01 | 6015908 |
| 20 | 201408817 | ආසියා පැසිපික් කලාපීය සංගම්වල ජාත්‍යන්තර සංගම්වල ආසියා පැසිපික් කලාපීය සම්මේලනය - IFALPA- | 2014.11.13 | 6012647 |
| 21 | 201408615 | 8 ඩිමෙන්ශියාවට එරෙහිව ආසියා සමාජයේ ජාත්‍යන්තර සමුළුව - ASAD 2014- | 2014.11.14 | 6019882 |
| 22 | 201410931 | ලෝක ඇසුරුම්කරණ සංවිධානය - WPO-Congress 2014 | 2014.11.17 | 1356901 |
| 23 | 201403514 | වඩා හොඳ වායු ගුණාත්මකතා සමුළුවක් - 2014 BAQ | 2014.11.19 | 6021531 |
| 24 | 201405353 | ලෝක ජෛව විවිධත්ව සම්මේලනය - WBC -2014 | 2014.11.24 | 6027818 |
| 25 | 201410932 | ආසියා පැසිෆික් ව්‍යාපාර සංසදය - APBF- 2014 | 2014.11.25 | 6029159 |
| 26 | 201410933 | 65 APRACA විධායක කමිටු රැස්වීම | 2014.12.01 | 6029160 |
| 27 | 201403229 | 10 CIB W102 ඉදිකිරීම් සම්මන්ත්‍රණයේදී තොරතුරු හා දැනුම් කළමන-ාකරණය පිළිබඳ ක්‍රියාකාරී කොමිසම | 2014.05.04 | 6016261 |
| 28 | 201402190 | 14 ආසියානු වෛද්‍ය සංගමයේ කොන්ග්‍රස සංගමය | 2014.03.13 | 6002467 |
| 29 | 201410871 | ආසියානු පැසිෆික් කලාපය - APR - බාල දක්ෂ නායකයින්ගේ සමුළුව 2014 | 2014.04.26 | 6029126 |
| 30 | 201410928 | 5 මූල්‍ය ස්ථාවරත්වය හා සම්භාව්‍ය අධීක්ෂණය සඳහා SEACEN නියෝජ්‍ය ආණ්ඩුකාරවරුන්ගේ රැස්වීම | 2014.09.11 | 6029157 |



## 4. පුහුණුව

### 4.1 ප්‍රාදේශීය පුහුණුව - යාපනය

අංක 38 දරන සංචාරක පනතින් බලාත්මක කර ඇති SLCB හි අරමුණු මුදුන් පමුණුවා ගැනීම පිණිස වෘත්තීමය ප්‍රමිත පවත්වාගෙන යෑම, MICE සංචාරක කර්මාන්තයේ සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ නිරතව සිටින්නන්ගේ වෘත්තීමය දක්ෂතා වර්ධනය කිරීම උනන්දු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා 2013 සහ 2014 වර්ෂවලදී SLCB විසින් ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් 6ක් මීගමුව, කළුතර, දඹුල්ල, මහනුවර, යාපනය සහ පාසිකුඩා හිදී පවත්වන ලදී.

මෙම වර්ෂයේදී මෙම කාර්යයන් නොකඩා සිදු කරමින්, 2015 මාර්තු මස 26 වැනි දින යාපනයේදී SLCB විසින් එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. 2005 අංක 38 දරන සංචාරක පනතින් (පිටු අංක 32-33) බලාත්මක කර ඇති පරිදි කාර්යාංශයේ අරමුණුවලට අනුව වෘත්තීමය තත්ත්ව පවත්වාගැනීම සහ සංචාරක කර්මාන්තයේ නිරතවන්නන්ගේ වෘත්තීමය දක්ෂතා සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම උදෙසා කොළඹින් බැහැර ප්‍රදේශවල හෝටල් හිමියන්/කළමනාකරුවන් යාවත්කාලීන සහ සවිබලග ැන්වීමෙහි මුලපිරීම් ඉදිරියට ගෙන යමින් SLCB, 2015 වර්ෂයේ එහි පළමු ප්‍රාදේශීය පුහුණු වැඩසටහන යාපනය ග්‍රීන් ග්‍රාස් හෝටලයේදී පවත්වන ලදී.

පුහුණුව සඳහා පුද්ගලයන් 60 දෙනෙකුට වඩා වැඩි පිරිසක් සහභාගි වූ අතර සහභාගිවන්නන් අතර හෝටල් හිමිකරුවන්, චාරිකා මෙහෙයවන්නන් සහ විශ්වවිද්‍යාලයේ සංචාරක කර්මාන්තය පිළිබඳ හදාරන අවසන් වසර සිසුන් විය.

SLCB ප්‍රවීනි විපුල වනිගසේකර මහතා, හිටපු අධ්‍යක්ෂ ජනරාල් සහ ගෝල්ඩන් අයිල් කළමනාකරණ අධ්‍යක්ෂ පැඩී පෝල් මහත්මිය සහ SLCB පර්යේෂණ සහ පුහුණු කළමනාකාරිනි ඉරෝෂි ජයවර්ධන මෙනවිය පුහුණුකරුවන් වශයෙන් මේ සඳහා සහභාගි වූහ.



පුහුණුකරු පැඩී පෝල්...



සහභාගීවන්නන් සිද්ධි අධ්‍යනය බෙදා හදා ගනිමින්...



සහභාගීවූවෝ පුහුණුකරුවන් සමඟ...

ගෝලීය සහ දේශීය සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය, විභවය, දිරිගැන්වීමේ සංචාරවල මෙහෙයුම් මූලිකාංග සහ නිර්මාණශීලිතාවය තුළින් තරඟකාරී වාසියක් ගොඩනගන්නේ කෙසේද යන්න වැඩසටහනෙන් ආවරණය කරන ලදී.

ඉතා සාර්ථක අයුරින් නිම වූ වැඩසටහන සහභාගිවන්නන් විසින් අතිශයින් අගය කරන ලද අතර ප්‍රදේශයේ සීමිත පුහුණු අවස්ථා පවතින බවද ඔවුන් විසින් සඳහන් කරන ලදී. ඉතා ධනාත්මත ප්‍රතිචාර දක්වන ලද අතර සහභාගිවූවන්ගේ බලවත් උද්යෝගය සැබවින්ම සැළකිය යුතු වේ. පුහුණු වැඩසටහනට සහභාගිවූවන්ගේ ධනාත්මත ප්‍රතිචාර සමඟින්, එවැනි වැඩසටහන්වලින් වෙනත් ප්‍රදේශද ඉමහත් ප්‍රයෝජන ලබනු ඇති බවට අපේක්ෂා කෙරේ.

### 4.2 ප්‍රාදේශීය පුහුණුව - මහනුවර

2015 වර්ෂය සඳහා දෙවැනි MICE පුහුණු වැඩසටහන මහනුවරදී පවත්වන ලදී. මහනුවර හෝටල් හිමියන්ගේ සංගමය සමඟ සහයෝගිත්වයෙන් ජූනි මස 16 වැනි දින මහනුවර, අර්ල්ස් රීජන්ට් හෝටලයේදී පවත්වන ලදී.

වැඩසටහන ඉතා සාර්ථක වූ අතර සහභාගිවූවන් විසින් අතිශයින් අගය කරන ලදී. මෙවැනි පුහුණු වැඩසටහන් නිරන්තරයෙන් පවත්වන මෙන් ඔවුන් ඉල්ලා සිටින ලදී.

පුහණුව සඳහා 58 දෙනෙකු සහභාගී වූ අතර බහුතරය මහනුවර පිහිටි හෝටල් නියෝජනය කරමින්ද නුවරඑළිය ප්‍රදේශයේ හෝටල් හිමියන් 8 දෙනෙකු පමණද සහභාගි වූහ. පුහුණුකරුවන් වූයේ සියාන් අමීන් මහතා - සභාපති, SLAPCEO, ෆිලීෂියා ආදිහෙට්ටි මහත්මිය - කළමනාකරණ අධ්‍යක්ෂ, බී කනෙක්ටඩ්, විපුල වනිගසේකර මහතා - ප්‍රවිනි, SLCB සහ ඉරෝෂී ජයවර්ධන මෙනවිය - පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු කළමනාකාරිනි, SLCB. කණ්ඩායම් අභ්‍යාස සහ එක් එක් කණ්ඩායම විසින් සිදු කළ ඉදිරිපත් කිරීමවලින් සැසිවාර සමන්විත විය.

ගෝලීය සහ දේශීය සංචාරක කර්මාන්තයේ වර්තමාන තත්ත්වය, විභවය, දිරිගැන්වීමේ සංචාරවල මෙහෙයුම් මූලිකාංග සහ නිර්මාණශීලිතාවය තුළින් තරඟකාරී වාසියක් ගොඩනගන්නේ කෙසේද ඇතුලත් වූ පහත සඳහන් අංශ වැඩසටහනෙන් ආවරණය කරන ලදී-

- සංචාරක කර්මාන්තය - ගෝලීය සහ දේශීය දෘෂ්ටිකෝණය - විපුල වනිගසේකර මහතා, ප්‍රවිනි/ කඅ SLCB
- MICE සංචාරක කර්මාන්තය නැඹුරුතා සහ ප්‍රවණතා - ඉරෝෂී ජයවර්ධන මෙනවිය-පර්යේෂණ, සංවර්ධන සහ පුහුණු කළමනාකාරිනි
- MICE අවස්ථා හැසිරවීම - ෆිලීෂියා ආදිහෙට්ටි මහත්මිය - කළමනාකරණ අධ්‍යක්ෂ, බී කනෙක්ටඩ්
- දිරිගැන්වීම්-කවුරුන්ද, කවරක්ද,මන්ද, කෙසේද - සියාන් අමීන් මහතා - සභාපති, SLAPCEO

### 4.3 ගෝලීය යාත්‍රා කර්මාන්තය සහ එය ශ්‍රී ලංකාවට වැදගත් වන්නේ කෙසේද පිළිබඳ කතිකාවත - මහාචාර්ය රොස් ඩෝලින්ග් විසින්

ඔස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ACBT) සමඟ එක්ව SLCB මහාචාර්ය රොස් ඩෝලින්ග් විසින් සිදු කරන ඉදිරිපත් කිරීමක් 2015 අගෝස්තු මස 04 වැනි දින සංවිධානය කරන ලද අතර එහිදී ඔහු යාත්‍රා සංචාරක කර්මාන්තය සඳහා ශ්‍රී ලංකාවට ඇති විභවය සම්බන්ධයෙන් දැනුවත් කරන ලද අතර මඟහැර යා යුතු උපද්‍රව පිළිබඳව අනතුරු ඇඟවීම්ද සිදු කරන ලදී.

ගෝලීය යාත්‍රා කර්මාන්තය සහ එය ශ්‍රී ලංකාවට වැදගත්වන්නේ කෙසේදී යන්න සම්බන්ධයෙන් ඔහු කරුණු විස්තර කරන ලදී.

මහාචාර්ය ඩෝලින්ග්, යාත්‍රා සංචාරක කර්මාන්තයෙහි නියැලෙන්නන් හමුවූ අතර අනාගත ක්‍රියාකිරකම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. මෙම විෂයයෙහි බොහොමයක් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඔහුගෙන් උපදෙස් ලබා ගත හැකි වේ.

මහාචාර්ය රොස් ඩෝලින්ග් සංචාරක කර්මාන්තය පිළිබඳ ප්‍රාරම්භක මහාචාර්යවරයෙකු සහ ඕස්ට්‍රේලියාවේ ඊඩිත් කොවාන් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර විද්‍යාලයේ, ව්‍යාපාර සහ නීති පීඨයේ සහාය ප්‍රධානී වේ. ඔහු ජාතික භූඋද්‍යානයන්හි UNESCO ගෝලීය ජාලය (ප්‍රංශය) සහ අන්තර්ජාතික යාත්‍රා පර්යේෂණ



සමාජය (ජර්මනිය) සඳහා උපදේශකයෙකු වේ.

ඔහු බටහිර ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත යාත්‍රා WA කමිටුවේ සභාපතිවරයා වන අතර යාත්‍රා සංචාරක කර්මාන්ත, භූ සංචාරක කර්මාන්ත සහ පරිසර සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයන්හි අන්තර්ජාතික පර්යේෂණ සිදු කරන අතර මේ වනවිට ප්‍රකාශන 200කට වඩා වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇත. මෑත වර්ෂයන්හිදී සංචාරක කර්මාන්තය පිළිබඳ පොත් 10ක සමකර්තෘ හෝ සමසංස්කාරක ලෙස කටයුතු කර ඇත.

### 4.4 ප්‍රාදේශීය පුහුණුව -මීගමුව

MICE ක්‍රියාකාරම් පිළිබඳ ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ පුහුණු වැඩසටහන තවදුරටත් සිදුකරමින් මීගමුව හෝටල් හිමියන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා වෘත්තීය සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ අවස්ථා සංවිධායකයන් ගේ සහයෝගිත්වයෙන් මීගමුව ජෙට්වින්ග් බීච් හෝටලයේදී 2015 අගොස්තු මස 31 වැනි දින සම්පූර්ණ දිනක පුහුණු සැසිවාරයක් පවත්වන ලදී.

MICE අවස්ථා හැසිරවීම පිළිබඳ හෝටල්වල විවිධ දෙපාර්තමේන්තු දැනුම්වත්/යාවත්කාලින කිරීම සඳහා ප්‍රාදේශිය වශයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට SLCB මූලිකත්වය ගන්නා ලදී. දිවයිනෙහි සිටින MICE විශේෂඥයින් සහ වෘත්තිකයන් විසින් පවත්වනු ලබන මෙම පුහුණුව සඳහා MICE හි නිරතව සිටින සියළුම හෝටල් හිමියන්ට අවස්ථාවක් ලබා දීම සහතික කිරීම සඳහා SLCB මෙම වැඩසටහන සෑම වර්ෂයකම දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී.

සහභාගිවන්නන් 40 දෙනෙකු පුහුණුව සඳහා සහභාගි වූ අතර ඉන් බහුතරය මීගමුව ප්‍රදේශයේ හෝටල් නියෝජනය කරන්නන් විය. පුහුණුකරුවන් වූයේ සියාන් අමීන් මහතා - සභාපති, SLAPCEO, ෆිලීෂියා ආදිහෙට්ටි මහත්මිය-කළමනාකරණ අධ්‍යක්ෂ, බී කනෙක්ටඩ්, විපුල වනිගසේකර මහතා-ප්‍රවිනි, SLCB සහ අචිනි දන්දූවගේ මෙනවිය-ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි, SLCB. කණ්ඩායම් අභ්‍යාස සහ ඉදිරිපත්කිරීම් සැසිවාරයට ඇතුලත් විය.




*ෆිලීෂියා ආදිහෙට්ටි මහත්මිය-කළමනාකරණ අධ්‍යක්ෂ, බී කනෙක්ටඩ්- MICE අවස්ථා හැසිරවීම කිරීම පිළිබඳව දැනුවත් කරමින්*



*විපුල වනිගසේකර මහතා, ප්‍රවිනි/කඅ SLCB -සංචාරක කර්මාන්තය - ගෝලීය සහ දේශීය දෘෂ්ටිකෝණය පිළිබඳව දැනුවත් කරමින්*

## 5. ප්‍රවර්ධන

### 5.1 ප්‍රචාරය

5.1.1 "අවුට්ලුක් 2015" පිළිබඳව TTG MICE ආසියා පැසිපික් මුල් පිටුවේ (2015 පෙබරවාරි/මාර්තු කලාපය) විස්තරය තුළින් ආසියාවේ රටවල් අතර ශ්‍රී ලංකාවට ප්‍රසිද්ධියක් ලැබිණි.

Outlook 2015



MY RESOLUTION 2015 "INCREASING THE FACILITIES WITHIN OUR CONFERENCE HALL, SUCH AS ADDING ANOTHER AUDITORIUM FOR 2,000-3,000 PAX, AND EXPANDING STALL SPACE TO ABOUT 600 STALLS FROM THE CURRENT 400."

**Bandula Ekanayake**
Director
Bandaranaike Memorial International Conference Hall

Tuk-tuks in Colombo

# Hopes pinned on first-ever MICE Travel Mart

**SRI LANKA**
*by Feizal Samath*

Having had a successful year in 2014 attracting small conferences and meetings, Sri Lanka aims to expand this segment in 2015, starting the ball rolling with a travel mart for regional incentive and conference planners.

According to Vipula Wanigasekera, general manager of Sri Lanka Convention Bureau (SLCB), a MICE Travel Mart – the first ever here – will be held in February or March where 50 to 100 incentive and conference planners from India, Pakistan, Bangladesh, Singapore, Malaysia, Indonesia and Vietnam will be hosted with pre-paid airfares and free hotel accommodation.

"We want to show this group – the most important in the MICE industry – the diversity of our offerings, ranging from city hotels to the green environment," he said.

The number of conferences in 2014 rose to 62, from 42 in 2013. A 10 to 20 per cent increase is forecast for this year.

Another initiative that is greatly anticipated for this year is a campaign roping in representatives of 200 government organisations to attend conferences abroad to promote the country as a conference destination, with a special push for Colombo.

"We met the heads and senior officials of these state organisations and impressed upon them the need to promote Sri Lanka through the conference circuit," he said.

In January, SLCB launched a mega promotion campaign in several Indian cities, including Mumbai and New Delhi, to promote meetings and incentive travel to Sri Lanka.

Lanka Exhibition & Conference Services general manager, Aasim Mukthar, said there has been a drop in Indian incentive visitors due to high hotel rates. For instance, five-star rooms in Colombo command a minimum of US$170 per night compared to US$100 or lower in Malaysia or Thailand.

"Indians also find it boring outside (their hotels in) Colombo as there is not much nightlife or after-dark entertainment," Mukthar added.

However, SLCB's Wanigasekera said while 50 per cent of the Indian incentive market may look for cheaper options, the rest is willing to pay for a unique product and this is where Sri Lanka stands out, he believed.

"Our diversity is unmatched and we are essentially one of the few green destinations still around," he explained.

**I predict...**



An increase in the number of Chinese companies participating in local trade fairs and exhibitions. There was an increase in 2014 and we see this growing in the next few years, particularly since China is due to enter into a Free Trade Agreement (FTA) with Sri Lanka.

Chinese companies view participating in local trade fairs as a window to the Sri Lankan market and sales of their products. The proposed FTA will be a huge facilitation.

**Aasim Mukthar**
General manager, Lanka Exhibition & Conference service



We are excited by the major promotional campaigns planned by the Sri Lanka Conventions Bureau (SLCB) through the MICE Travel Mart and also a campaign encouraging hundreds of government representatives attending overseas conferences to make a bid to host the next meeting in Sri Lanka.

These are challenging initiatives and we are fully backing SLCB in this endeavour and its many promotions that would take place in India next year.

**Zian Ameen**
General manager, Aitken Spence Exhibitions and Conventions, and president, Sri Lanka Professional Conference, Exhibition and Events Organisers



5.1.2. CEI ආසියා හි ලැබුනු ප්‍රචාරය

cei 2015 INDUSTRY EXCELLENCE IN BUSINESS EVENTS 15th Anniversary

ශ්‍රී ලංකාව බොහොමයක් සම්මන්ත්‍රණ සහ දිරිගැන්වීම් ලබා ගනී;
මෙම වර්ෂයේදී අන්තර්ජාතික සහ කලාපීය අවස්ථා 50කට වඩා වැඩි සංඛ්‍යාවක්
2015 මාර්තු 17 ජෙරඩීන් ඩොනෝ-ටැන්

විදේශ බැඳියාව වර්ධනය වීම සහ යටිතලපහසුකම් වර්ධනය වීමත් සමඟ ව්‍යාපාර අවස්ථා සඳහා ශ්‍රී ලංකාව එහි උප-මහද්වීපයෙන් ඔබ්බට ගමන් කරමින් සිටී. 2014 වර්ෂයේදී ඉදිකිරීම්, ප්‍රවාහන සහ රබර් වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණ විශාල සංඛ්‍යාවක් පැවති අතර මෙම වර්ෂයේදී අන්තර්ජාතික සහ කලාපීය සම්මන්ත්‍රණ 50කට වඩා වැඩි සංඛ්‍යාවක් පවත්වනු ඇත.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ (SLCB), ප්‍රවීනි විපුල වනිගසේකර මහතා මෙසේ පවසයි: "නව දේපළ ඇතුලත්ව යටිතලපහසුකම් දියුණුවීමත් සමඟ සම්මන්ත්‍රණ ව්‍යාපාරය ඉතා වේගයෙන් දියුණු වෙමින් පවතී. ශ්‍රී ලංකාව විවිධාකාරයේ ස්ථාන සහ නිෂ්පාදනද ඉදිරිපත් කරයි"ඒවා දිරිගැන්වීම් වැඩසටහන් සඳහා උපකාරී වන අතර අපගේ කර්මාන්ත විශේෂඥයන්ට නිර්මාණශීලි, ගෙවන මුදලට වටිනාකමක් සහිත යෝජනා ඉදිරිපත් කළ හැකි වේ. "

රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන සහ අවස්ථා සඳහා SLCB ට එක එකක් සඳහා ඉලක්කගත වෙළඳපොළක් සහ ප්‍රවර්ධන උපාය මාර්ගයක් සහිත වෙනස් වූ උපාය මාර්ග 5ක් පවතී.

ආසියා පැසිපික් කලාපය සම්මන්ත්‍රණ සඳහා ප්‍රධාන වේ; දිරිගැන්වීම් චාරිකා සඳහා ඉන්දියාව සහ යුරෝපය; සහ ඒකාබද්ධ රැස්වීම් සඳහා ඉන්දියාව සහ ඈත පෙරදිග. කෙසේවෙතත්, ප්‍රදර්ශන තවමත් ප්‍රධාන වශයෙන් කලාපීය වේ.

SLCB හි සර්වශුභවාදය විශාල දේශීය වෘත්තීය සම්මන්ත්‍රණ සංවිධායකයන් සහ ගමනාන්ත කළමනාකරණ සමාගම් විසින් හවුලේ භුක්ති විඳිනු ලැබේ.

එයිට්කන් ස්පෙන්ස් කන්වෙන්ෂන්ස් ඇන්ඩ් එක්ෂිබිෂන්ස් හි සහකාර සාමාන්‍යාධිකාරී සියාන් අමීන් මහතා මෙසේ පවසයි, "දිරිගැන්වීම් සහ සම්මන්ත්‍රණවල විශාල වර්ධනයක් අපට දැකගත හැකි වේ. චීනයෙන් වෙනත් රටවල සංචාර සහ ගිනිකොණදිග ආසියාවෙන් ඒකාබද්ධ රැස්වීම් ඉහළ යන තත්ත්වයක පවතී."

"ලෝකය වටා දිරිගැන්වීම් කණ්ඩායම් ආකර්ෂණය කර ගනිමින්, පැසිපික් වර්ල්ඩ් ශ්‍රී ලංකා සහ පැසිපික් වර්ල්ඩ් මාලදිවයින මෙහෙයුම් සිදු කිරීම සඳහා එයිට්කන් ස්පෙන්ස්, පැසිපික් වර්ල්ඩ් සමඟ හවුල්කාරීත්වයක් ඇති කරගෙන ඇත."

මෙම ජනවාරි මාසයේදී ෆිලිප්ස් ආයතනයේ සාමාජිකයන් 1600ක් වැනි විශාල කණ්ඩායමක් ඉන්දියාවෙන් ගෙන්වා ගැනීමට වෝකර්ස් ටුවර්ස් සමත් වී ඇති අතර තරු පහේ හෝටල් 4ක් අතර පිරිස බෙදා හැර ශ්‍රී ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන මධ්‍යස්ථානයේදී හමුවීම් සිදු කරන ලදී. අනෙක් විශාල කණ්ඩායම් ඩොමිනෝස් පිට්සා සහ කොකාකොලා ආයතනවලිනි. අනාගත ඉලක්කගත වෙළඳපොළවල් වන්නේ සිංගප්පූරුව, මැලේසියාව සහ ඉන්දුනීසියාව වේ.

විදේශ ආයතනද වෙළඳපළට ඇතුලත් වෙමින් සිටී. සිංගප්පූරුවෙන් ස්පියර් කොන්ෆරන්සස්,

මියන්මාරයේ ''ෆස්ට් මුවර්'' ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා පැමිණ සිටී. 2014 වර්ෂයේ ශ්‍රී ලංකා ආගන්තුක සත්කාර ආයෝජන සම්මන්ත්‍රණයෙහි සමාරම්භක අවස්ථාවේදී ආයෝජකයන් සහ සංවර්ධකයන් ඉන්දියන් සාගර කලාපය පිළිබඳව එවැනි විශාල උනන්දුවක් පෙන්වන ලද අතර මෙම වර්ෂයේ මැයි මස සම්මන්ත්‍රණයේදී මාලදිවයින, මුරුසි දිවයින, ෂීෂෙල්ස් සහ ශ්‍රී ලංකාව ආවරණය කරනු ඇත.

වැඩි ගුවන් ගමන් වාර ගණන, පැමිණීමේදී සහ අන්තර්ජාලය ඔස්සේ වීසා ලබා දීම සහ කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය චාරිකා සඳහා පහසුකම් සපයයි. 2016-2017 වර්ෂවලදී හිල්ටන් හෝටලයට අමතරව වෙනත් ගෝලීය සන්නාම වන හයට්, මැරියොට්, මෝවින්පික්, ෂෙරටන් සහ ෂැන්ග්‍රිලා මෙරට විවෘත වනු ඇත.

5.1.3 රාමායන පුරාවෘත්තය නැවත දියත් කිරීම පිළිබඳ මාධ්‍ය නිවේදනය

Daily News
Sri Lanka's National Newspaper Since 1918

2015 පෙබරවාර 26 වැනි බ්‍රහස්පතින්දා

රාමායන පියමඟ (trail) නැවත පිහිටුවීම
ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවය සමඟ එක්ව රාමායන පියමඟ ඉදිරි මාසවලදී නැවත දියත් කරනු ඇත. හඳුනාගත් ස්ථාන 52ක් අතරින් ප්‍රවේශ විය හැකි ස්ථාන 14ක් විවිධ සංචාර සැලසුම් සහ පැකේජ තුළින් විශාල වශයෙන් ප්‍රවර්ධනය කරනු ඇත.



ඉන්දියාව සහ ශ්‍රී ලංකා අතර බෙදා හදා ගන්නා සංස්කෘති උරුමයෙහි වැදගත් කොටසක් රාමායන ජනශ්‍රැති මඟින් විස්තර වේ. රාමායන කථාංග යේ ප්‍රධාන කොටසක් ශ්‍රී ලංකාව තුළ සිදු වි ඇති අතර එබැවින් රාමායන වීර කාව්‍යයෙහි ශ්‍රී ලංකාව සුවිශේෂිතාවයක් දරනු ලැබේ. මෙම තත්ත්වය උපයෝගී කර ගනිමින් ඉන්දියාවෙන් වන්දනා චාරිකා ප්‍රවර්ධනය කළ හැකි වේ.

භූවිද්‍යාත්මක ස්ථාන, ගල්ගුහා, කඳු සහ පන්සල්වලින් සමන්විත වන සීතා දේවිය සංචාරය කළ ස්ථාන දැක බලා ගැනීමට හින්දු ජනතාව විශාල උනන්දුවක් දක්වනු ලැබේ. සීතාඑළිය, රාවණා ඇල්ල, හග්ගල, මාළිගාතැන්න, රූමස්සල සහ කැළණිය රාමායන ප්‍රවාදය හා බැඳුනු ප්‍රමුඛ ස්ථාන කිහිපයකි.

පසුගිය වසර කිහිපය තුළදී, ඉන්දියාව, ශ්‍රී ලංකාව සඳහා ප්‍රධාන සංචාරක සහ එෂෑ සංචාර උත්පාදනය කරනු ලබන වෙළඳපොළ බවට පත් වී ඇත. ඉන්දියානු වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය බොහොමයක් නව සංචාරක නිෂ්පාදන සකස් කර ඇත. ඒකබද්ධ රැස්වීම සහ දිරිගැන්වීම් සඳහා පහසුකම් ලබා දීම ඒ අතර වේ." සංචාරක සැලසුමක් සමඟ විස්තීර්ණ රාමායන පොත් පිංචක් ඇතුළු ප්‍රවර්ධන ද්‍රව්‍ය අප විසින් ලබා දෙනු ලැබේ."බඖජ් සමඟ සිදු කරන අපගේ ඉන්දියානු ප්‍රවර්ධනයන් තුළදී ඉන්දියාවේ ආගමික ආයතන අතර පියමඟ අප විසින් ප්‍රවර්ධනය කරනු ලැබේ."

"ඉන්දියාව කරා යන වන්දනා ගමන් හා සමානව, රාමායන වීරකාව්‍යට අනුව සීතා දේවිය සංචාරය කළ බව සඳහන් ස්ථාන පමණක් අප විසින් ප්‍රවර්ධනය කරනු ලැබේ." "හින්දූන් සහ රාමායන භක්තිකයන් වන ඉහළ මට්ටමේ ඉන්දියානු ඒකාබද්ධ සේවාදායකයන්ට රාමායන පියමඟ පිළිබඳ ආයෝජන අවස්ථා ඉදිරිපත් කිරීම අපට අවශ්‍ය වේ, SLCB ප්‍රවීනි විපුල වනිගසේකර මහතා පැවසීය.



5.1.4 2015 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාව සත්කාරකත්වය දක්වන ලද විශාලතම කණ්ඩායම සමබන්ධයෙන් ඉන්දියාවේ M&IT සමුහය විසින් ප්‍රචාරයක් ලබා දීම.

m&it INDIA
meetings & incentive travel

විශාලම ඉන්දියානු MICE කණ්ඩායමට ශ්‍රී ලංකාව සත්කාරකත්වය දක්වයි

මෙතෙක් ඉන්දියාවෙන් පැමිණි විශාලතම MICE කණ්ඩාමයට ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාව සත්කාරකත්වය දක්වන ලද අතර 1,600ක නියෝජිත පිරිසක් දිවයිනට පැමිණියහ. පිලිප්ස් ඉන්දියා, විදුලි සහ විනෝදාත්මත ඉලෙක්ට්‍රොනික දැවැන්තයා, එහි දිරිගැන්වීම් කණ්ඩායම කොළඹ ප්‍රධාන හෝටල් කිහිපයක කාමර 800ක, එක් කාමරයක දෙදෙනා බැගින් හවුලේ භාවිතා කිරීමේ පදනමින් ලැගුම්ගත් අතර වැඩි වශයෙන් ආසියාවේ කෙටි ගමනාන්ත දිරිගැන්වීම් මාලාවත් පවත්වන ලදී.

